කැළණිය විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි දෙවන වසර පරීක්ෂණය (බාහිර)- 2012/13

2016 - ඔක්තෝම්බර්

**BCOME 2073 - සංවර්ධන ආර්ථික විද්‍යාව**

ප්‍රශ්න සංඛ්‍යාව - 07

කාලය - පැය තුනයි (03)

ඕනෑම ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

---

01. අ. අධ්‍යාපනය හා සෞඛ්‍ය සඳහා කරන ආයෝජනය බද්ධ ආයෝජනයක් ලෙස සලකන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ. අධ්‍යාපනය හා සෞඛ්‍ය සඳහා කරන ආයෝජනය ඉහළ නැංවීම තුලින් ශ්‍රී ලංකාවට අත්පත් කර ගත හැකි ප්‍රතිලාභ මොනවාදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 10)
(මුළු ලකුණු 20)

02. " ලෝක ජනගහන වර්ධනය තුලින් ශ්‍රම බලකාය ඉහළ නංවා ගත හැකි නිසා ජනගහන වර්ධනය ගැටළුකාරී නොවේ". මෙම ප්‍රකාශය විචාරාත්මකව ඇගයීමකට ලක් කරන්න.

( මුළු ලකුණු 20)

03. අ. දියුණුවෙමින් පවතින රට වල දැකියහැකි පොදු ලක්ෂණ මොනවාදැයි විස්තර කරන්න.

(ලකුණු 10)

ආ. රටක සංවර්ධනය මැනීම සඳහා මානව සංවර්ධන දර්ශකය අනෙකුත් දර්ශක සමඟ සසඳන කළ කොතෙක් දුරට අනුකුල වේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)
(මුළු ලකුණු 20 )

04. අ. කෘෂිකාර්මික නිෂ්පාදනයේ විකාශනය පැහැදිලි කරන්න.

(ලකුණු 10 )

ආ. " කෘෂිකාර්මික දියුණුව හා ග්‍රාමීය සංවර්ධනය තුලින් රටක් සංවර්ධනය කළ නොහැකි අතර වැඩි අවධානයක් යොමු වියයුත්තේ කාර්මික හා සේවා අංශයන් වෙතටය". මෙම ප්‍රකාශය විචාරාත්මකව ඇගයීමකට ලක් කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20 )

05. ආර්ථික වර්ධනය හා සංවර්ධනය කිරීමේ උපායමාර්ගයක් ලෙස ශ්‍රී ලංකාව සෘජු විදේශ ආයෝජන කෙරෙහි වැඩි අවධානයක් යොමු කරයි. සෘජු විදේශ ආයෝජන සම්බන්ධයෙන් පක්ෂව හා විපක්ෂව ඇති තර්ක පැහැදිලි කරන්න.

(මුළු ලකුණු 20 )

06. අ. ආතර් ලුවිස්ගේ ශ්‍රම අතිරික්ත න්‍යාය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ. ආර්ථික සංවර්ධනයට ඇති එක් බාධකයක් වනුයේ දුගී බවයි. ශ්‍රී ලංකාවේ දුගී බව පහළ දැමීම සඳහා ක්‍රියාත්මක කළ හැකි විකල්ප ප්‍රතිපත්ති යෝජනා කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20 )

07. පහත දැක්වෙන දෑ සඳහා කෙටි සටහන් ලියන්න.

අ. ආදායම් විෂමතාවය මැනීමේ මිනුම් දඬු

ආ. ශ්‍රී ලංකාවේ සේවාවියුක්ති ගැටලුව

ඇ. බුද්ධි ගලනය

ඉ. ගෝලීයකරණය

(ලකුණු 05 බැගින් )

(මුළු ලකුණු 20 )